# විවෘත සහ දුරස්ථ අධ්‍යයන කේන්ද්‍රය

## ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි ද්විතීය පරීක්ෂණය
## (බාහිර) - 2008

## මානවශාස්ත්‍ර පීඨය

## බෞද්ධ සංස්කෘතිය - BUCU- E2025

## බෞද්ධ සමාජ චින්තාව පුදසිරිත් හා උත්සව

**එක් කොටසකින් ප්‍රශ්න දෙකක්වත් තෝරාගෙන**
**ප්‍රශ්න පහකට (05) පිළිතුරු සපයන්න**

ප්‍රශ්න සංඛ්‍යාව : 10 යි                                    කාලය : පැය 03 යි

---

### 1 කොටස

01. මිනිසාගේ ආධ්‍යාත්මික හා බාහිර චර්යාවන් මිනිස් සමාජයේ පරිණාමය කෙරෙහි ඇතිකළ බලපෑම අග්ගඤ්ඤ සූත්‍රය ඇසුරින් සාකච්ඡා කරන්න.

02. පුද්ගල ස්වාමිත්වය පිළිබඳ බෞද්ධ ආකල්පය සමකාලීන වෛදික බ්‍රාහ්මණ ඉගැන්වීම් සමග සසඳමින් අගය කරන්න.

03. සමාජානුයෝගී දහැමි පුද්ගලයෙකු ගොඩනැගීමට බෞද්ධ ඉගැන්වීම් වෙසෙසින්ම උපකාරීවන අන්දම දේශනානුසාරයෙන් පෙන්වා දෙන්න.

04. ධන පරිහරණය පිළිබඳ බෞද්ධ ඉගැන්වීම් පෙන්වා දෙමින් ඒවායේ ප්‍රායෝගික අගය විමසුමට ලක්කරන්න.

05. බෞද්ධ රාජ්‍ය පාලනය තුළින් ප්‍රකටවන ජනහිතකාමී සුභසාධන පිළිවෙත අදාළ මූලාශ්‍රය ඇසුරින් පැහැදිලි කරන්න.

### 11 කොටස

06. අවවාදයෙන් මෙන්ම ආදර්ශයෙන්ද ආගමික සහජීවනය ප්‍රකට කළ ශාස්තෘවරයෙකු වශයෙන් බුදුරදුන් අගය කළ හැක්කේ කවර කරුණු අනුවදැයි සනිදර්ශනව පෙන්වා දෙන්න.

07. "පුද පූජා පිළිබඳ ආදි බෞද්ධ ආකල්පය අන්තගාමිත්වයෙන් තොරය." විමසන්න.

08. ලක්දිව පරිත්ත සජ්ඣායනයේ මූලික අරමුණ පිළිබඳ ප්‍රමාණවත් විවරණයක් කරන්න.

09. පැරණි ලක්දිව ප්‍රචලිතව පැවති බෞද්ධ පූජෝත්සව දෙකක් ඓතිහාසික මූලාශ්‍රය ඇසුරින් විමසුමට ලක් කරන්න.

10. පහත දැක්වෙන මාතෘකාවලින් **දෙකකට** ප්‍රමාණවත් විවරණ සපයන්න.

    1. ත්‍රිවිධ චෛත්‍යය පිළිබඳ බෞද්ධ සංකල්පය
    2. පුණ්‍යානුමෝදනයෙහි ආගමික පදනම
    3. ලක්දිව ගැමි අභිචාරවිධිවල බෞද්ධ ආභාෂය
    4. බුදුදහම හා දෙවි දේවතා ඇදහිලි